සියලු ම හිමිකම් ඇවිරිණි All Right Recerved

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
2015

# ආර්ථික විද්‍යාව
# ECONOMICS

ඇගයීම් අංක - **07**

විනාඩි 30 යි
30 Minutes

01. **(i)** අ. ශ්‍රමය හා මානව ප්‍රාග්ධනය

**ශ්‍රමය යනු,** භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොදාගත හැකි සියලුම කායික හා මානසික ප්‍රයත්නයන් ය. ශ්‍රමය ලෙස සලකන්නේ ශ්‍රමිකයා නොව ශ්‍රමිකයාගේ කායික හෝ මානසික ශක්තියයි. ශ්‍රම ශක්තිය ශ්‍රම කාලය මගින් මනිනු ලැබේ.

**මානව ප්‍රාග්ධනය** යන්නෙන් අදහස් කරන්නේ කිසියම් පුද්ගලයෙකු විසින් අධ්‍යාපනය, පුහුණුව හා අත්දැකීම් මගින් අත්කරගනු ලැබූ නිපුණතා, දැනුම, සමාජයීය හා පෞරුෂත්ව ගුණාංග සම්භාරයයි.

ශ්‍රමය ඕනෑම පුද්ගලයෙකු තුළ දක්නට ලැබුනද, මානව ප්‍රාග්ධනය යටතට ගැනෙන්නේ ආයෝජනය තුළින් නිපුණත්වයට පත්කළ ශ්‍රමයයි.

ආ. ස්ථාවර ප්‍රාග්ධනය යනු නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා නැවත නැවත යොදා ගත හැකි ක්ෂය වීමෙන් අවසන් වන කල්පවත්නා ප්‍රාග්ධන වත්කම් වේ. මේවා භාවිතයට යොදා ගැනෙන ජීවිත කාලය මුළුල්ලේ ම ප්‍රතිලාභ ප්‍රවාහයක් එම සම්පත් හිමිකරුට ලබා දීමට සමත් වේ.
උදා : යන්ත්‍ර සූත්‍ර, කර්මාන්තශාලා, උපකරණ, ගබඩා

සංසරණ ප්‍රාග්ධනය යනු නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගැනෙන අමුද්‍රව්‍ය තොග, නිෂ්පාදන ක්‍රියාවලිය තුළ නිෂ්පාදනය වෙමින් පවත්නා සියලුම භාණ්ඩ (අර්ධ නිමි තොග) හා බෙදාහැරීම සඳහා ගබඩාවල සූදානම් කොට ඇති නිමි භාණ්ඩ තොග යනාදිය යි.

**(ii)** **ඵලදායිතාව යනු,** නිෂ්පාදන සාධකයක් සතු නිෂ්පාදන ශක්තිය හෙවත් නිමැවුම් බිහිකිරීමේ හැකියාව යි. නැතහොත් යෙදවුම් ඒකකයකින් ලබාගත හැකි නිමැවුම් ඒකක ප්‍රමාණය යි

යෙදවුම් ඒකකයකින් කොතරම් ඒකක ප්‍රමාණයක් ලැබේද යන්න මත ඵලදායීතාව මූර්ත වශයෙන් මනිනු ලැබේ.

$$\text{ඵලදායිතාව} = \frac{\text{නිමැවුම් ඒකක ප්‍රමාණය}}{\text{යෙදවුම් ඒකක ප්‍රමාණය}}$$

(ලකුණු 02 යි)

සාධක ඵලදායිතාව නැංවීම වැදගත් වන්නේ එමඟින්,

- නිෂ්පාදන පිරිවැය පහළ වැටීම.
- ඉහළ ලාභ උපයාගත හැකි වීම.
- නිෂ්පාදන තරඟකාරිත්වය ඉහළ යාම.
- ආයෝජන ප්‍රවර්ධනය කළ හැකි වීම.
- ආර්ථික වෘද්ධියට දායක වීම. නිසාය. (ඕනෑම කරුණු 2 කට ලකුණු 02 යි)

**(iii)** හැකිය. (ලකුණු 01 යි)

හිඟකම යනු අසීමිත මිනිස් වුවමනා සපුරා ගැනීම සඳහා සමාජය සතු සම්පත් සම්භාරය ප්‍රමාණවත් නොවීමයි. මිනිස් වුවමනා අසීමිත වීම සහ සම්පත් සම්භාරය සීමිත වීම, සෑම සමාජයකම පොදු ලක්ෂණ බැවින් හිඟකම පිළිබඳ ප්‍රශ්නය සෑම සමාජයකටම පොදුය. (ලකුණු 01 යි)

ලෝකයේ විවිධ රටවල් විවිධ නිෂ්පාදන හැකියා මට්ටම්වල සහ සංවර්ධන මට්ටම්වල පසුවන බව සැබෑය නමුත් හිඟකම ප්‍රශ්නය සෑම සමාජයකටම එකසේ බලපාන පොදු කරුණක් වේ.
මන්ද ඕනෑම රටක මිනිස් වුවමනා දක්වෙන්නේ ඒ ඒ රටවල සමාජ සංවර්ධනයට සාපේක්ෂව වේ. එබැවින් රටවල් වෙන් වෙන්ව ගත් කළ දිළිඳු රටවලට වඩා ධනවත් රටවල ජනතාවගේ ජීවන තත්ත්වය උසස් වූවද, ඔවුන්ගේ දියුණු හා සංකීර්ණ වුවමනාවලට සාපේක්ෂව හිඟකම ප්‍රශ්නය එකසේ බලපායි. (ලකුණු 02)

**(iv)** අ.

උද්ධමන පීඩනයකින් තොරව ආර්ථිකයකට නිපදවිය හැකි උපරිම තිරසාර නිමැවුම් මට්ටම, විභව නිමැවුම වේ. විභව නිමැවුම යනු උපරිම නිමැවුම නොව, තිරසාර ලෙස පවත්වාගෙන යා හැකි උපරිම නිමැවුම් මට්ටමයි. සාර්ව ආර්ථිකයේ දිගු කාලීන උපනතිය හෙවත් ආර්ථික වෘද්ධිය පෙන්නුම් කෙරෙන්නේ මෙම විභව නිමැවුම ඔස්සේ වේ. (ලකුණු 02 යි)

ආ. 1. කොතරම් භාණ්ඩ ප්‍රමාණයක් නිපදවා ගැනීමේ ශක්තියක් ආර්ථිකය සතුව පවතීද (විභව නිෂ්පාදිතය)
2. එම නිෂ්පාදන ශක්තිය, භාණ්ඩ නිපදවීම සඳහා කොතරම් දුරට උපයෝගී කරගෙන තිබේද ? (නිෂ්පාදන හැකියාව උපයෝජනය කරගැනීම) (ලකුණු 02 යි)

**(v)** ශ්‍රම විභජනයේ වාසි

1. ඵලදායිතාව ඉහළ යාම
2. යන්ත්‍ර සූත්‍ර හඳුන්වා දීමේ හැකියාව
3. නවෝත්පාදනයන් බිහි වීම
4. කාලය ඉතිරිවීම
5. පුද්ගල සංවර්ධනය පහසුවීම
6. කාර්යක්ෂමතාව වැඩිවීම (කරුණු 2 කට ලකුණු 2 යි)

ශ්‍රම විභජනයේ අවාසි

1. එකම කාර්යයක නිරතවීම නිසා (ඒකාකාරී වීමෙන්) එම කාර්යය නීරස වී ශ්‍රම ඵලදායිතාවය පහත වැටීම.
2. එක් සේවකයකුගේ අකාර්යක්ෂමතාව හෝ නොපැමිණීම සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියට ම බලපෑම් කිරීම. (පරායත්තතාව)
3. එකම කාර්යයක නිරත වීම තුළින් වෘත්තීය රෝගවලට ගොදුරු වීම.
4. පටු විශේෂීකරණය නිසා රැකියාව පිළිබඳ අවදානම.
5. පුද්ගල සංවර්ධනයට බාධා ඇති වීම. (කරුණු 2 කට ලකුණු 2 යි)



සැකසුම ඃ බණ්ඩාර දිසානායක
B.Sc.(Mgt)Sp